පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛ 01/2024

මගේ අංකය - CLG/AC/04/05-11
පළාත් පාලන කොමසාරිස් කාර්යාලය
සබරගමුව පළාත
2024.11.28

සබරගමුව පළාතේ සියලු පළාත් පාලන ආයතනවල පරිපාලන ප්‍රධානීන් වෙත

**පළාත් පාලන ආයතන විසින් මහජන සෞඛ්‍යයට අදාල බලතල ක්‍රියාත්මක කිරීම හා අදාල අතුරු ව්‍යවස්ථා යටතේ වූ බලපත්‍ර අධිකාරී බලතල ක්‍රියාත්මක කිරීම.**

පළාත් පාලන ආයතන සංස්ථාපනයට අදාලව කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමෙහිලා ප්‍රමුඛ වගකීමක් වන්නේ බල ප්‍රදේශය තුල මහජන සෞඛ්‍යට අදාලව සියලු කරුණු විධිමත් කර පාලනය කර පරිපාලනය කර එමගින් බල ප්‍රදේශය තුල ජීවත් වන මහජනතාවට සුවපහසුව ජීවත් වීමට හැකි පරිසරයක් ඇති කිරීමයි. මීට අදාලව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 78 වගන්තියේ සිට 120 වගන්තිය දක්වා විධිවිධාන, 255 වන අධිකාරය නගර සභා ආඥා පනතේ 103 වගන්තියේ සිට 128 ආ වගන්තිය දක්වා වන විධිවිධාන හා 252 වන අධිකාරය මහා නගර සභා ආඥා පනතේ 96 වගන්තිය සිට 160 වගන්තිය දක්වා වගන්ති යටතේ මෙන්ම මහජන සෞඛ්‍යට අදාලවන විවිධ වූ ආඥා පනත් හා පනත් මගින් අදාල පළාත් පාලන ආයතනයට මූලික නීතිය යටතේ වූ බලතල පිරිනැමී ඇත.

02. ඉහත ආකාරයට මූලික නීතිය හා සෙසු නීතිය යටතේ පිරිනමා ඇති අතුරු නීතිමය බලතලවලට අතිරේකව පළාත් පාලන ආයතන මහජන සෞඛ්‍ය හා සම්බන්ධයෙන් නෛතික වගකීම ඉටු කිරීමෙහිලා ඉතා වැදගත් වන්නේ මූලික නීතිය යටතේ පනවා ගනු ලබන අතුරු ව්‍යවස්ථා වේ.

03. විශේෂයෙන්ම මූලික නීතියේ සඳහන් මහජන සෞඛ්‍ය විධිමත් කිරීමේ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් පළාත් පාලන ආයතන අතුරු ව්‍යවස්ථා මගින් ලබා දෙන සහාය ඉතා වැදගත් වේ. පළාත් පාලන ආයතන වෙත පිරිනැමී ඇති බලපත්‍ර අධිකාරී බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා අදාල වන බලපත්‍ර අතුරු ව්‍යවස්ථා මගින් හටගන්නා අතර එම බලපත්‍ර ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධයෙන් වන වැඩිමනත් කරුණු අතුරු ව්‍යවස්ථා මගින් පාලනය වේ. සබරගමුව පළාතේ පළාත් පාලන ආයතන විසින් 252 වන අධිකාරිය මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය සමග කියවිය යුතු 267 වගන්තිය යටතේත්, 255 වන අධිකාරිය නගර සභා ආඥා පනතේත් 157 වගන්තිය සමග කියවිය යුතු 153 වගන්තිය යටතේත්, 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය සමග කියවිය යුතු 122 වගන්තිය යටතේත් සාදන ලද මහජන සෞඛ්‍යයට අදාල අතුරු ව්‍යවස්ථා මගින් බලපත්‍ර අධිකාරී බලතල ක්‍රියාත්මක වන අවස්ථා පවතී. එසේම 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ විධිවිධාන යටතේ සබරගමු පළාතේ ඒ ඒ පළාත් පාලන ආයතන විසින් අදාල කරගත් අතුරු ව්‍යවස්ථා මගින් බලපත්‍ර අධිකාරී බලතල ක්‍රියාත්මක කරනු ලබයි.

04. පළාත් පාලන ආයතනයක් විසින් කටයුතු කිරීමේදී අතුරු ව්‍යවස්ථා යටතේ ගොඩනගනු ලබන බලපත්‍ර අධිකාරී බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඊට අදාල වන ව්‍යවස්ථාපිත කාර්ය පරිපාටිය හා ස්වභාවික යුක්ති රීතීන් ආදී මූලික නීති සංකල්ප මත පිහිටා කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. එහෙත් පළාත් පාලන ආයතන යටතේ අදාල කාර්ය ඉටු කිරීම් හා සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමේදී නිරීක්ෂණය වන ප්‍රධාන කරුණක් වන්නේ ලිඛිත නීතියෙන් පිරිනැමී ඇති බලපත්‍ර අධිකාරී බලතල ව්‍යවස්ථාපිත කාර්ය පටිපාටීන්ට හා මූලික නීති සිද්ධාන්තයන්ට අනුකූලව සිදුකරන්නට කරුණු යෙදී නොමැති බවයි.

05. එබැවින් පළාත් පාලන ආයතන විසින් බලාත්මක කර ඇති අතුරු ව්‍යවස්ථා යටතේ ක්‍රියාත්මක කල යුතු බලපත්‍ර අධිකාරී බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා ඊට අදාල වන ලිඛිත නීතියේ සඳහන් විධිවිධානයන්ට යටත්ව මෙහි මතු සඳහන්වන උපදෙස් සැලකිල්ලට ගෙන කටයුතු කල යුතු බව අවධාරණය කරමි.

(අ) පළාත් පාලන ආයතනය විසින් අතුරු ව්‍යවස්ථා යටතේ ක්‍රියාත්මක කරනු ලබන බලපත්‍ර වාර්ෂික බලපත්‍ර වන අතර බලපත්‍රයක වලංගු කාලය අදාල වර්ෂයේ ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින කාලය හෝ ඒ අතර කාල සීමාවකි. වාර්ෂික බලපත්‍රයක් සඳහා අයකල යුතු බලපත්‍ර ගාස්තු මූලික නීතියේ සඳහන් විධිවිධානයන්ට යටත්ව පළාත් පාලන ආයතන විසින් නියම කල යුතු වේ. කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍රයක් ඉල්ලුම් කිරීමේ පූර්ව අවශ්‍යතා සම්පූර්ණ කිරීමක් වශයෙන් අනුමැතියක් අපේක්ෂාවෙන් කරනු ලබන ඉල්ලීමකට අදාලව පරීක්ෂණ ගාස්තුවක් අය කිරීමට අතුරු ව්‍යවස්ථා මගින් බලය දී ඇත්තේ නම් එම ගාස්තු පිළිබඳ උපරිමයන්ද සභාව විසින් නියම කර තීරණය කල යුතු වේ. බලපත්‍ර ගාස්තු නියම කිරීමට අදාලවන සෑම නියමයක්ම අදාල වර්ෂය උදා වීමට පෙරාතුව එනම් පූර්ව වර්ෂයේ දෙසැම්බර් 31 ට පෙරාතුව ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කල යුතු වේ.ඒ ආකාරයට අය කරනු ලබන ගාස්තුවට අමතරව රජය විසින් නියම කර ඇති රජයේ බදු මුදල් අය කිරීමටද ක්‍රියා කල යුතු වේ.

(ආ) එසේම කිසියම් ලිත් වර්ෂයක් සඳහා බලපත්‍රයක් ඉල්ලුම් කිරීමට අදාලවන අතුරු ව්‍යවස්ථාවට අනුව අදාල කර්මාන්ත/ව්‍යාපාර ස්වභාවය අනුව බලපත්‍රයක් ඉල්ලුම් කිරීමේ පූර්ව අවශ්‍යතාවයක් වශයෙන් බලපත්‍ර අධිකාරීත්වය විසින් අනුමැතියක් අපේක්ෂා කරන විටෙක ඊට අදාල අනුමැතිය ලබාදීමේ දී අයකල යුතු ගාස්තු අතුරු ව්‍යවස්ථාවෙන් බලය දී ඇති ආකාරයට පළාත් පාලන ආයතනය විසින් තීරණය කර ගැසට් පත්‍රයන් මගින් ප්‍රකාශයට පත්කල යුතු වේ.

(ඇ) කිසියම් පළාත් පාලන ආයතනයක් විසින් තම බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක කර ඇති අතුරු ව්‍යවස්ථා අනුව බලපත්‍රවලට යටත් කර්මාන්ත/ව්‍යාපාර වෙනුවෙන් ඉදිරි මුදල් වර්ෂය සඳහා බලපත්‍ර ඉල්ලුම් කරන්නන්ට අවස්ථාව සලසා දීම, ඉදිරි වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු නියම කිරීමට අදාල නියමයන් ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කර ඇති විටකදී පූර්ව වර්ෂයේ දෙසැම්බර් 01 දිනෙන් ආරම්භ කර තිබීම, ඉදිරිපත් වන ඉල්ලුම් පත්‍ර සම්බන්ධයෙන් වන පරිපාලන ක්‍රියාවලිය සඳහා පහසුවක් වනු ඇත. බලපත්‍ර වලට යටත් වන පරිදි කර්මාන්ත ස්වභාවයන් ව්‍යාපාර ස්වභාවයන් යටතේ පරිශ්‍ර පවත්වාගෙන යනු ලබන තැනැත්තන් වෙත අදාල බලපත්‍රය ලබා ගැනීම සඳහා ක්‍රියා කල යුතු ආකාරය පිළිබඳව ඔවුන් වෙත ඒ සඳහා උනන්දුවක් ඇති වන පරිදි ප්‍රමාණවත් දැනුවත් කිරීම් බලප්‍රදේශය තුල අඛණ්ඩව සිදු කිරීමට සෑම පළාත් පාලන ආයතනයකම පරිපාලන බලධාරීන් විසින් ක්‍රියා කල යුතුය.

(ඈ) පළාත් පාලන ආයතනයට අතුරු ව්‍යවස්ථා යටතේ වන බලපත්‍රයක් වෙනුවෙන් ඉදිරිපත් වන ඉල්ලුම් පත්‍ර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ නිර්දේශ සඳහා ඉදිරිපත් කරලීමට හැකිතාක් කඩිනමින් කටයුතු කල යුතු අතර සෑම අයදුම්පත්‍රයක්ම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ආමන්ත්‍රිත ආවරණ ලිපියක් සමඟින් ඉදිරිපත් කල යුතුය. එසේ යොමු කරන අයදුම්පත්‍ර සම්බන්ධයෙන් වන නිර්දේශ හැකිතාක් කඩිනමින් ලබාගැනීම සඳහා පළාත් පාලන ආයතනයේ ඒ හා සම්බන්ධ රාජකාරී වගකීම පැවරී ඇති නිලධාරීන් විසින් කටයුතු කල යුතුය. එසේම පළාත් පාලන ආයතනයට යොමු වන අදාල අයදුම්පත්‍ර අවම වශයෙන් සතියකට වරක්වත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත යොමු කිරීම සඳහා පළාත් පාලන ආයතනයේ පරිපාලන බලධාරීත්වය විසින් ක්‍රියා කල යුතුය.

(ඉ) පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුල පිහිටියා වූ බලපත්‍රයකට යටත් ව්‍යාපාරික කර්මාන්ත ස්වභාවයන් හඳුනාගැනීම, තොරතුරු ලබා ගැනීම හා කර්මාන්ත බද්ද හා ව්‍යාපාර බද්දට ඉතිරිවන පරිශ්‍ර හඳුනාගැනීම සඳහා සිදුකරන දේපල සමීක්ෂණ කටයුතු ප්‍රවර්ථන වර්ෂයේ ජනවාරි 01 දින ආරම්භ කර මාර්තු 31 දිනෙන් අවසන් කිරීමට හැකිවන පරිදි සිදු කිරීම සඳහා සියලු පියවර ගැනීම පළාත් පාලන ආයතනයේ විධායක ප්‍රධානියාගේ හා පරිපාලන ප්‍රධානියාගේ වගකීම වන්නේය. ඒ සඳහා පළාත් පාලන ආයතනයේ යෙදවිය හැකි කාර්ය මණ්ඩල හඳුනා ගැනීමටත් එසේ හඳුනා ගනු ලැබූ කාර්ය මණ්ඩල අදාල කාර්යය සඳහා ප්‍රමුඛතාව ලැබෙන පරිදි රාජකාරි වැඩ පවරා දීමටත් පළාත් පාලන ආයතනයේ විධායක ප්‍රධානියා හා පරිපාලන ප්‍රධානියා විසින් ක්‍රියා කල යුතුය.

(ඊ) පළාත් පාලන ආයතනයට යොමු වී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී නිර්දේශ සඳහා යොමු කරන ලද බලපත්‍ර සඳහා වන ඉල්ලුම්පත් නැවත පළාත් පාලන ආයතනය වෙත යොමු කිරීමේදී අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව අදාල පරිශ්‍රයන් සඳහා බලපත්‍රයන් නිකුත් කිරීමට පැහැදිලිව නිර්දේශ කර තිබේද නැද්ද යන්න පිළිබඳවත්, නිර්දේශ කර නොමැත්තේනම් එසේ නිර්දේශ නොකිරීමට බලපෑ හේතු කවරේද යන්න පිළිබඳවත් සඳහන් කර තිබේද යන්න පිළිබඳව සැලකිලිමත් විය යුතුය. කිසියම් ඉල්ලුම්පත්‍රයක් සඳහා බලපත්‍රයක් ලබා දීම නිර්දේශ නොකරන අවස්ථාවලදී පළාත් පාලන ආයතනයේ බලපත්‍රදායී බලතල පිරිනැමී ඇති මහා නගර සභාවේ නාගරික කොමසාරිස්, නගර සභාවේ, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ඔවුන් විසින් ඒ සඳහා නිශ්චිතව බලය පවරන ලද නිලධාරියා විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලුම්පත්‍රයට අදාලව බලපත්‍රය ලබා දීම ප්‍රතික්ෂේප කරන බව ඊට අදාල වූ හේතු සඳහන් කරමින් ඉල්ලුම්කරු වෙත හැකිතාක් කඩිනමින් දැනුම් දිය යුතුය.එසේම කිසියම් ඉල්ලුම්පත්‍රයකට අදාල බලපත්‍රයක් ලබා දීම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් නිර්දේශ කර ඇති විටකදී හා අදාල අතුරු ව්‍යවස්ථාවේ සඳහන් අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කර ඇතිවිටකදී ඊට අදාලව ඉල්ලුම්කරු වෙත බලපත්‍රයක් නිකුත් කිරීමට පළාත් පාලන ආයතනයේ බලපත්‍රදායී බලතල පිරිනැමී ඇති තැනැත්තා විසින් ක්‍රියා කල යුතුය. එලෙස බලපත්‍රයක් නිකුත් කිරීමේදී පළාත් පාලන ආයතනය විසින් නියම කර ඇති පරිදි වූ බලපත්‍ර ගාස්තුව අය කිරීමට ක්‍රියා කලයුතු අතර ඒ වෙනුවෙන් නිකුත් කරනු ලැබූ බලපත්‍රයට අතිරේකව අයකරනු ලැබූ ගාස්තු සඳහා වන නියමිත ලදුපත බලපත්‍ර ඉල්ලුම්කරු වෙත නිකුත් කල යුතුය.

(උ) පළාත් පාලන ආයතනය විසින් අදාල වර්ෂයේ මාර්තු 31 දිනට නිම කරනු ලබන සමීක්ෂණයේ වාර්තාව පදනම් කර ගනිමින් ඒ වනවිට බලපත්‍ර ඉල්ලුම් කර ලබා ගැනීමට යෙදී ඇති ව්‍යාපාර කර්මාන්ත පරිශ්‍රයන් හා බලපත්‍රයකට යටත්ව බලපත්‍රයක් ලබාගෙන නොමැති ව්‍යාපාර කර්මාන්ත පරිශ්‍ර හඳුනාගැනීම කල යුතුය. ඒ වන විට බලපත්‍රයක් ඉල්ලුම් කරන්නට යෙදී ඇතත් පරිපාලනමය ක්‍රියාවලිය තුල ඒ පිළිබඳ තවදුරටත් තීරණයක් ගෙන නොමැති ව්‍යාපාර කර්මාන්ත පරිශ්‍ර හැර සෙසු බලපත්‍රයක් නොලත් එහෙත් බලපත්‍රයකට යටත් පරිශ්‍ර සඳහා අතුරු ව්‍යවස්ථා කඩ කිරීම යටතේ මහේස්ත්‍රාත් අධිකරණයේ චෝදනා පැමිණිලි කිරීම සඳහා පළාත් පාලන ආයතනයේ බලයලත් නිලධාරී විසින් ක්‍රියා කල යුතු වේ. එසේම ඒ වන විටත් බලපත්‍රයක් ඉල්ලුම් කර අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසි සම්පූර්ණ වී නොතිබීම හේතුකොටගෙන ප්‍රතික්ෂේප වී ඇති බලපත්‍ර වෙනුවෙන් බලපත්‍රයක් නොමැති ව්‍යාපාර/කර්මාන්ත ස්වභාවය යටතේ අතුරු ව්‍යවස්ථා කොන්දේසි කඩ කිරීම යටතේ මහේස්ත්‍රාත් අධිකරණයේ චෝදනා පැමිණිලි කිරීම සඳහා පළාත් පාලන ආයතනයේ බලයලත් නිලධාරී විසින් ක්‍රියා කල යුතු අතර ඒ සඳහා වන ක්‍රියාමාර්ග අදාල වර්ෂයේ මැයි මස 31 දින වනවිට ගෙන තිබිය යුතුය.

(ඌ) අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ පරිශ්‍රයක් සම්බන්ධයෙන් වුවද අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසීන්ට අනුකූලව අදාල බලපත්‍රය දරන්නේද, ඊට අනුකූලව පරිශ්‍රය පවත්වාගෙන යනු ලබන්නේද, නිරන්තර අධීක්ෂණයට ලක් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් විය යුතු අතර ඒ සම්බන්ධයෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙතින් අවශ්‍ය සහය ලබා ගත යුතුය. කිසියම් අවස්ථාවක අතුරු ව්‍යවස්ථාවට පටහැනිව බලපත්‍රයක් ලත් ව්‍යාපාරික/කර්මාන්ත පරිශ්‍රයක් පවත්නා විටකදී අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ව්‍යවස්ථාපිත කාර්යය පටිපාටියට අනුකූලව අදාල බලපත්‍රය අවලංගු කිරීම සඳහා ක්‍රියා කල යුතුය. එසේ ක්‍රියාත්මක වන සෑම අවස්ථාවකදීම අතුරු ව්‍යවස්ථා කඩ කිරීම යටතේ එම පරිශ්‍රයට අදාලව මහේස්ත්‍රාත් අධිකරණයේ චෝදනා පැමිණිලි කිරීම සඳහා ක්‍රියා කිරීමට පළාත් පාලන ආයතනයේ බලයලත් නිලධාරියා විසින් ක්‍රියා කල යුතුය.

(එ) පළාත් පාලන ආයතනය විසින් බල ප්‍රදේශය තුල දේපල සමීක්ෂණ නිම කිරීමෙන් පසුව වුවද අදාල ලිත් වර්ෂයේ ඕනෑම අවස්ථාවක පළාත් පාලන ආයතනය විසින් ක්‍රියාත්මක කරන අතුරු ව්‍යවස්ථාවන්ට අදාලව බලපත්‍රයකට යටත් ව්‍යාපාර/කර්මාන්ත ස්වභාවයක් ආරම්භ වේ නම් ඒ සෑම ව්‍යාපාරයක්/කර්මාන්තයක් සම්බන්ධයෙන්ම අදාල ලිත් වර්ෂයේ ඉතිරි කාලසීමාව සඳහා අතුරු ව්‍යවස්ථාව යටතේ වූ වාර්ෂික බලපත්‍රය අදාල වේ.

(ඒ) ඒ සඳහා අදාලවන ව්‍යාපාර/කර්මාන්ත හඳුනා ගැනීම සඳහා නිශ්චිත වැඩපිළිවෙලක් හා ඒ සඳහා අදාලවන පාර්ශව උනන්දු කරවීමේ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීමට පළාත් පාලන ආයතන විසින් උනන්දු විය යුතුය. එසේ හඳුනා ගනු ලබන ව්‍යාපාර/කර්මාන්ත සම්බන්ධයෙන් බලපත්‍රයක් ලබා ගැනීමට ලබා දෙන සාධාරණ කාලයක් ඇතුලත බලපත්‍රය ලබා නොගන්නේ නම් පෙර සඳහන් කල ආකාරයටම අතුරු ව්‍යවස්ථා කඩ කිරීම යටතේ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීම සඳහා පළාත් පාලන ආයතනයේ බලයලත් නිලධාරී ක්‍රියා කල යුතුය.

(ඔ) ඉහත ආකාරයට බලපත්‍රයක් නොලත් ව්‍යාපාරයක්/කර්මාන්තයක් පවත්වාගෙන යාම හේතුවෙන් අතුරු ව්‍යවස්ථා කඩ කිරීම් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරු කරනු කරනු ලැබූ සෑම තැනැත්තෙකුම එසේ වරදකරු වී සාධාරණ කාල සීමාවකින් ඔබ්බට තවදුරටත් අදාල ව්‍යාපාරය/කර්මාන්තය පවත්වාගෙන යනු ලබයි නම් ඒ සම්බන්ධයෙන් 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 167 (1) උප වගන්තිය යටතේත්, 255 වන අධිකාරය නගර සභා ආඥා පනතේ 128 අ වගන්තිය යටතේත්, 252 වන අධිකාරය මහා නගර සභා ආඥා පනත 148 අ වගන්තිය යටතේත් සමාප්ති ආඥාවක් ලබා ගැනීම සඳහා මහේත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කිරීම පළාත් පාලන ආයතනයේ බලයලත් නිලධාරියාගේ වගකීම වන්නේය. තවද පළාත් පාලන ආයතනයකට අදාලව අතුරු ව්‍යවස්ථා කඩ කිරීම යටතේ මහේස්ත්‍රාත් අධිකරණය වෙත චෝදනා පැමිණිලි කිරීමේදී වරද සිදු කල දිනෙන් මාස 06 ක කාල සීමාවක් තුල අදාල චෝදනා පැමිණිලි කිරීම සිදු කල යුතු වේ. අදාල වන බලපත්‍රය ලිත් වර්ෂයක් සඳහා අනුරූපී වන බලපත්‍රයක් වන හෙයින් සහ එකී බලපත්‍රය ලබා ගැනීම සඳහා සාධාරණ කාලයක් වශයෙන් පැවති ව්‍යාපාරයක් කර්මාන්තයක් වෙනුවෙන් අදාල වර්ෂයේ මාර්තු 31 දින දක්වා වන කාලය ඉතිරි කල යුතු හෙයින් පළාත් පාලන ආයතනයේ පරිපාලන ප්‍රධානින් හා ඊට අදාල බලයලත් නිලධාරීන් ලිඛිත නීතියේ ඒ හා සම්බන්ධයෙන් වන පියවර අවධානයෙන් යුතුව සම්පූර්ණ කිරීම ඉතා වැදගත් වේ.

(ඕ) තවද කිසියම් පරිශ්‍රයක් සඳහා අතුරු ව්‍යවස්ථාවක් යටතේ වූ බලපත්‍රයක් නිකුත් කිරීමේදී අදාල අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ සඳහාවන බලපත්‍රයක ආකෘතියක් හඳුන්වා දී ඇත්නම් එකී ආකෘතියට අනුකූල වූ බලපත්‍රයක්ම ඒ සඳහා නිකුත් කල යුතුය. එසේම බලපත්‍රයට අදාලවන අතුරු ව්‍යවස්ථාව යටතේ ඊට අදාලවන බලපත්‍ර සඳහා ආකෘති නියම කර නොමැත්තේනම් පළාත් පාලන ආයතනය විසින් මෙම චක්‍රලේඛණයේ උප ලේඛණයේ විස්තර කරනු ලබන ආකෘතියට අනුකූලව ඒ ඒ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන බලපත්‍ර සකස් කර ගැනීම කල යුතුය.

(ඖ) ඉහත උපදෙස් නිසි ආකාරව සැලකිල්ලට ගනිමින් සෑම පළාත් පාලන ආයතනයක් විසින්ම මහජන සෞඛ්‍ය හා සම්බන්ධව අතුරු ව්‍යවස්ථා බලපත්‍ර ක්‍රියාවලිය සම්පූර්ණ කල යුතු අතර ඒ හා සම්බන්ධයෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හා ඒ කාර්ය මණ්ඩල සමඟ අවශ්‍ය සම්බන්ධීකරණයන් පවත්වාගෙන යාම සිදු කල යුතුය. සෑම ලිත් වර්ෂයකම මාර්තු මාසය අවසන් වීමෙන් පසු ගතවන සෑම මාසයක් සඳහාම බලපත්‍ර ක්‍රියාත්මක වීම හා සම්බන්ධයෙන් බලපත්‍ර ඉල්ලුම් කිරීම/නිකුත් කිරීම හා පසු විපරම් ක්‍රියාවලිය පිළිබඳ සමාලෝචනයන් අදාල පළාත් පාලන ආයතනයෙන් නාගරික කොමසාරිස්/ නගර සභා, ප්‍රාදේශීය සභා ලේකම් විසින් සිදු කල යුතු බවද අවධාරණය කරමි. එයට අදාල වාර්තාවක් දිස්ත්‍රික් සහකාර පළාත් පාලන කොමසාරිස් සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත යොමු කල යුතුය.

එල්.එම්.පී.ඩබ්.බණ්ඩාර
පළාත් පාලන කොමසාරිස්
සබරගමුව පළාත

පිටපත්

1. ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය ස.ප - කා.දැ.ස
2. ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය - කා.දැ.ස
3. ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය, ස.ප.ස - කා.දැ.ස
4. සහකාර පළාත් පාලන කොමසාරිස් රත්නපුර / කෑගල්ල - කා.දැ.ස
5. CLG/AD/01, CLG/LG/07 විෂය නිළධාරී - අ.කා.ස

සභාවේ නිල ලාංඡනය

................................මහා නගර සභාවේ / නගර සභාවේ / ප්‍රාදේශීය සභාවේ ............................ අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයයි.

01. ව්‍යාපාරික/කර්මාන්ත ස්වභාවය - ..........................................................................................................

02. ව්‍යාපාරික/ කර්මාන්ත ස්ථානයේ ලිපිනය - ..........................................................................................

03. බලපත්‍රලාභියාගේ නම - ..........................................................................................................................

04. බලපත්‍රලාභියාගේ ජාතික හැඳුනුම්පත් අංකය - ...................................................................................

05. බලපත්‍රලාභියාගේ පෞද්ගලික ලිපිනය - ...............................................................................................

06. බලපත්‍රයේ වලංගු කාලය - .................................. දින සිට .......................................දින දක්වා (අතුරු ව්‍යවස්ථා කොන්දේසි කඩකිරීමකදී මෙම බලපත්‍රය අවලංගු කල හැක)

07. බලපත්‍රයට අදාල වන කොන්දේසි සම්බන්ධයෙන් වන යොමුව - .............................................................

08. නිකුත් කල දිනය - ..........................................................................

(බලපත්‍රය නිකුත් කරන අයගේ අත්සන නම තනතුර සහ නිල මුද්‍රාව සඳහන් කල යුතුය.)